ASSETLINE FINANCE LIMITED

**විශේෂ දැනුම්දීමයි: බැංකු ගනුදෙනුවල සුපරීක්ෂාකාරීබව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය**

**හිතවත් අනුකූලතා නිලධාරීන් වෙත,**

මේ උදාවන අලුත් අවුරුද්දේ, ඔබගේ ගනුදෙනුකරුවන් බැංකු ගනුදෙනු සිදු කිරීමේදී ඔවුන්ගේ සුපරීක්ෂාකාරීබව තහවුරු කිරීමට ඔබ ගත් පියවර තව දුරටත් පවත්වා ගෙන යෑම ඉතා වැදගත් වේ.

ගනුදෙනුකරුවන්, විශේෂයෙන්ම ඔවුන්ගේ නොසැලකිලිමත්බව හේතුවෙන්, වංචනික ක්‍රියාකාරකම්වල ගොදුරු බවට පත්වූ අවස්ථාවන්හී ඉහළ යාමක ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිරීක්ෂණය කර ඇත.

මේ අනුව, පහත පණිවුඩ ඔබේ ගනුදෙනුකරුවන්ට ලබාමදන ලෙස අපි ඔබට මතක කර සිටිමු:

**01.** **පුද්ගලික තොරතුරු ආරක්ෂා කරගන්න** - ගනුදෙනුකරුවන් මුරපද (Passwords), PIN, OTP වැනි සංවේදී තොරතුරු වෙනත් පුද්ගලයන් හට ලබා දීමෙන් වැළකී සිටිය යුතුය. මන්ද, මෙම මතාරතුරු ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා තීරණාත්මක කරයභාරයක් සිදු කරයි.

**02.** **ගිණුම් ප්‍රවේශය පාලනය** - ඔබේ ගනුදෙනුකරුවන් තෙවන පාර්ශවයන්ට ඔවුන්ගේ ගිණුම් ක්‍රියාත්මක කිරීමට අවසර නොදිය යුතුයි. මන්ද, තෙවන පාර්ශවයක බැංකු ගිණුම හරහා අනවසර ගනුදෙනු සිදු කර ඇත්නම්, එම බැංකු ගිණුමේහිමිකරු ඊට වගකිව යුතු අතර අදාළ නීතිය බලාත්මක කිරීමේ ආයතනය සමග කටයුතු කිරීමට ගිණුම් හිමිකරුට සිදුවේ.

සියළුම ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සහ ඔවුන් වෙහෙස මහන්සි වී උපයාගත් මුදල ආරක්ෂා කර ගැනීම සඳහා මෙම පණිවුඩය බෙදා හරින ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය ඔබෙන් ඉලලා සිටියි. මෙම ආරක්ෂිත සහ වැළැකවීමේ පියවර ක්‍රියාවට නැංවීම, ආරක්ෂාව සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමට සහ සියලු පාර්ශවකරුවන් සඳහා ආරක්ෂිත බැංකු පරිසරයක නිර්මාණය කිරීමට දායක වේ.

මෙම පණිවුඩය බෙදා හැරීම සඳහා ඔබගේ සහයෝගීතාව ඉතා අගය කොට සලකන අතර අනුකූලතාව සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සඳහා ඔබගේ අඛණ්ඩ කැපවීම වෙනුවෙන් අපි ඔබට ස්තූතිවන්ත වෙමු.

ඔබට සුභ අලුත් අවුරුද්දක වේවා!

**අධ්‍යක්ෂක**
**මූල්‍ය බුද්ධි ඒකකය**